# දකුණු පළාතේ ත්‍රීරෝද රථ රියදුරන් සඳහා
# ප්‍රථමාධාර පුහුණු වැඩසටහනක්

දකුණු පළාතේ ත්‍රීරෝද රථ රියදුරන් සඳහා ප්‍රථමාධාර පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලෙස දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා මහතා පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාට උපදෙස් ලබා දී ඇත.

මෙම නවවැඩපිළිවෙල පිළිබඳ අදහස් දැක්වූ ප්‍රධාන අමාත්‍යවරයා අද මහාමාර්ග අනතුරු ඉතාම බහුල බවත්, එම අනතුරුවලින් තුවාල ලබන පිරිස ක්ෂණිකව රෝහල් කරා ගෙන යාමේදී ත්‍රීරෝදරථ උපයෝගී කර ගැනීම වැඩි වශයෙන් දැක ගත හැකි වන බවත්, නිවසේ සිදුවන හදිසි ආපදා වලින් අනතුරට පත්වන රෝගීන් රෝහල් කරා ප්‍රවාහනයේදීත් බොහෝ දෙනෙකු ත්‍රීරෝද රථවල සහාය ලබා ගන්නා බවත්, එම ත්‍රීරෝද රථවල සේවය කරන රියදුරන් ලබා දෙන මෙම යහපත් සේවාව වඩා ගුණාත්මක ලෙස සංවර්ධනය කිරීම මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන අරමුණ වන බවත් පැවසීය.

අනතුරට පත්වන පුද්ගලයා ක්ෂණිකව රෝහලට ගෙනයන්න හැමදෙනාම උනන්දු වෙනවා. නමුත් ඉන් බොහෝ දෙනෙකුට රෝගියෙකු නිසි ලෙස ප්‍රවාහනය කිරීම හා ප්‍රවාහනයට ප්‍රථම ලබා දිය යුතු ප්‍රථමාධාර පිළිබඳ නිසි අවබෝධයක් නෑ. මේ නිසා යම් අවස්ථාවල රෝගීන්ගේ ජීවිත අනතුරට පත්වූ අවස්ථා අප දැක තිබෙනවා. මේ පුහුණුව මගින් අප බලාපොරොත්තු වන්නේ මේ මූලික අත්දැකීම් ත්‍රීරෝද රථ රියදුරන් වෙත ලබා දීමයි. මේ නිසා න්‍යායාත්මකවත්, ප්‍රායෝගිකවත් කරන මේ පුහුණුව ජීවිත බේරා ගැනීමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන පිරිසට වඩා ඵලදායීව හා කාර්යක්ෂමව තම සේවය ලබා දීමට හේතුවනු ඇත.

මෙම ප්‍රථමාධාර පුහුණුව රජයේ රෝහල්වලට අනුබද්ධව සේවය කරන පුහුණුවලත් වෛද්‍යවරු හා කාර්යමණ්ඩල උපයෝගී කර ගෙන ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇති අතර, පළාතේ එක් එක් දිස්ත්‍රික්ක මට්ටමින් තෝරාගත් පිරිසක් සඳහා එම පුද්ගලයන්ගේ ආසන්නතම රෝහල් උපයෝගී කරගෙන මූලික පුහුණු සැසි ක්‍රියාත්මක කෙරෙනු ඇත.

පුහුණුව ලබා දීමෙන් පසු එක් එක් ප්‍රදේශවල ත්‍රීරෝද රථ හිමියන් ගොඩනගා ගෙන ඇති ත්‍රීරෝද රථ සංගම් සඳහා රෝගීන් ආරක්ෂා සහිතව ප්‍රවාහනයේ දී රෝගියාට පැලඳිය යුතු ආරක්ෂිත ඇඳුම් කට්ටල ලබා දීමට බලාපොරොත්තු වන අතර එම ප්‍රථමාධාර පුහුණුව සඳහා සහභාගී වූ අය විසින් පදවන ත්‍රීරෝද රථයේ "ප්‍රථමාධාර පුහුණුවලත් රියදුරෙක් විසින් පදවන රථයකි"යන සටහන යොදා ධාවනය කිරීමට ද අවස්ථාව සළසා දෙනු ඇත.

මේ අකාරයෙන් පුහුණුව ලබා දීම මගී ප්‍රවාහනය සඳහා විශේෂ කාර්යභාරයක් ඉටු කරන ත්‍රීරෝද රථ සේවාවේ ගුණාත්මක බව වැඩි කිරීමට හේතු වනු ඇති බවට දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා මහතා බලාපොරොත්තු පළ කරයි.

# ජාතික සෞඛ්‍ය සතිය වෙනුවෙන් දකුණු පළාතේ විශේෂ වැඩසටහන් රැසක්

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහින්ද චින්තන ඉදිරි දැක්මට සමගාමීව ඔක්තෝම්බර් 03 දින සිට 09 දින දක්වා සෞඛ්‍ය අමාත්‍ය මෛත්‍රීපාල සිරිසේන මහතාගේ මැදිහත්වීම මත ජාතික සෞඛ්‍ය සතියට සමගාමීව දකුණු පළාත තුළ සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කිරීමට කටයුතු සංවිධානය කර ඇති බව ප්‍රධාන අමාත්‍ය ශාන් විජයලාල් ද සිල්වා මහතා පැවසීය.

එම වැඩපිළිවෙල අනුව ජාතික සෞඛ්‍ය සතිය ක්‍රියාත්මක වන කාලය තුළ දකුණු පළාතේ සෑම පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී කොට්ඨාශයකම ඩෙංගු හා මදුරු මර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශ මට්ටමින් සෞඛ්‍ය සායන පැවැත්වීම සිදු කෙරෙනු ඇත.

මීට අමතරව පළාත තුළ ක්‍රියාත්මක වන ස්වේච්ඡා සංවිධානවල දායකත්වය ලබා ගනිමින් රෝහල් වාට්ටු පිරිසිදු කිරීමේ හා ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩපිළිවෙලක් සංවිධානය කිරීමට ප්‍රධාන අමාත්‍යතුමන් බලාපොරොත්තු වේ.

මෙම සතිය තුළ පළාතේ පාසල් හා රාජ්‍ය ආයතනවල විශේෂ ශ්‍රමදාන පවත්වා එම ආයතනවල පරිසරය පිරිසිදු කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස එම ආයතන වෙත දැනුම් දීමට පියවර ගෙන ඇති අතර බෝ නොවන රෝග පිළිබඳ සායන පැවැත්වීමට ඉල්ලුම් කරන රජයේ ආයතනවල එම සතිය පුරා අඛණ්ඩව ඉව සායන පැවැත්වීම  සිදු කෙරෙනු ඇත.

# දකුණේ රෝහල්වලට නඩත්තු ඒකක

පළාත් සෞඛ්‍ය සංවර්ධන වැඩසටහන යටතේ පළාතේ මූලික රෝහල් 08 ක නඩත්තු ඒකක පිහිටුවන ලෙස පළාත් ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා මහතා උපදෙස් ලබා දී ඇත.

නව වැඩ ඒකක සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට ප්‍රධාන අමාත්‍යවරයා විසින් රුපියල් මිලියන 1.7 ක ප්‍රතිපාදන වෙන්කර ඇත. එම වැඩසටහන යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ බලපිටිය, ඇල්පිටිය හා උඩුගම මූලික රෝහල්වලත් මාතර දිස්ත්‍රික්කයේ දෙනියාය හා කඹුරුපිටිය රෝහල්වලත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්ස, වලස්මුල්ල හා තංගල්ල මූලික රෝහල්වලත් මෙම නඩත්තු ඒකක ආරම්භ කෙරෙනු ඇත.

මෙම නඩත්තු ඒකක මගින් රෝහල් උපකරණවල හදිසි හා සුළු නඩත්තු කටයුතු එම ආයතනය තුළදීම සිදු කර ගැනීමත් රෝහලේ ගොඩනැගිලිවල සුළු අලුත්වැඩියාවන් එම ඒකකය මගින් ඉටු කර ගැනීමට අපේක්ෂා කරන බව පැවසූ ප්‍රධාන අමාත්‍යවරයා මේ ඒකක ආරම්භ කිරීමත් සමග සුළු නඩත්තු කටයුතු සඳහා මේ තාක් බාහිර ආයතනවලට ලබා දුන් මුදල් රෝහල් සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට හැකිවනු ඇති බවට බලාපොරොත්තු පළ කරයි.

රෝහල් සතුව මෙබඳු නඩත්තු ඒකක නොමැතිකමින් ඉතා සුළු අළුත්වැඩියාවකින් නැවත භාවිතයට ගත හැකි බොහෝ උපකරණ භාවිතයෙන් ඉවත් කර රෝහල් තුල එක් රැස් කර ඇති ආකාරය නිරීක්ෂණය කිරීමෙන් පසු ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා මහතා විසින් මෙම නව වැඩසටහන ඉතා කඩිනමින් ක්‍රියාවට නන්වන ලෙස පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාට උපදෙස් ලබා දී ඇත.

මෙම නව වැඩ ඒකකවල නඩත්තු කටයුතු පවත්වා ගෙන යාම සඳහා රෝහලේ ඒ පිලිබඳ දක්ෂතා දක්වන කාර්ය මණ්ඩලයේ සහය ලබා ගැනීමටත් ඊට අමතරව වෘත්තිය පුහුණු ආයතනවල පුහුණුව ලබන ආධුනික කාර්මික ශිල්පීන්ගේ සහය ලබා ගැනීමටත් විශේෂ වැඩපිලිවෙලක් සංවිධානය කර ඇත.

පළාතේ මූලික රෝහල් 08 තුල ක්‍රියාත්මක වන මෙම වැඩසටහන ඉදිරියේදී අනෙකුත් සියළුම රෝහල් වෙත ව්‍යාප්ත කිරීම තමන් බලාපොරොත්තු වන බව ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා මහතා පැවසීය

## දකුණු පළාතේ වතු හා නාගරික ප්‍රජාවගේ සෞඛ්‍ය පහසුකම් සංවර්ධනය කෙරේ.

වතු හා නාගරික අංශයේ සනීපාරක්‍ෂක කටයුතු සංවර්ධනය කිරීමේ විශේෂ වැඩසටහනක් දකුණු පළාත තුළ ක්‍රියාවට නන්වා ඇති බව දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය ශාන් විජයලාල් ද සිල්වා මහතා පවසයි.

එම වැඩසටහන යටතේ නාගරික හා වතු අංශයේ සනීපාරක්‍ෂක කටයුතු වැඩි දියුණු කිරීම සඳහා වැසිකිළි  1100ක් ඉදිකිරීම මේ වනවිටත් ආරම්භ කර ඇත. රුපියල් මිලියන 11ක් මෙම වැඩසටහන සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙන් කර දී ඇත.

සනීපාරක්‍ෂක වැඩසටහන යටතේ ගාල්ල, මාතර දිස්ත්‍රික්කවල වැසිකිළි 600ක් හා හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ වැසිකිළි 500ක් ඉදිකිරීම මේ වනවිට සිදු කෙරෙමින් පවතින අතර වැසිකිළි 475ක ඉදිකිරීම් කටයුතු අවසන් කර ජනතා අයිතියට පත්කර ඇත.

වතු හා නාගරික ප්‍රජාවගේ සනීපාරක්‍ෂක තත්වය ඉහළ නැංවීම ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක කර ඇති මෙම වැඩසටහන පිළිබඳ අදහස් දැක්වූ ප්‍රධාන අමාත්‍ය ශාන 'විජයලාල් ද සිල්වා මහතා පවසන්නේ සනීපාරක්‍ෂක පහසුකම් වර්ධනය වියයුතු ක්‍ෂේත්‍ර සාපුවම ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක මෙම වැඩපිළිවෙළ සාර්ථක කර ගැනීමට එම ප්‍රජාවගේ දායකත්වය උපරිමයෙන් ලබා දීම අත්‍යවශ්‍ය බවයි.

නාගරික හා වතු ප්‍රජාව සඳහා රජය විශාල මුදලක් වැය කිරීම රජයේ ජනතාවාදී වැඩපිළිවෙළ විදහා දක්වන අවස්ථාවකි. රජය ලබා දෙන මෙම පහසුකම් සුරක්‍ෂිතව තම  භාවිතයට ගැනීම සැම දෙනාගේ වගකීමකි.

## දකුණේ පුරන් කුඹුරු සම්ප්‍රදායික වී වගා කටයුතු සඳහා යොදා ගැණේ.

දකුණු පළාතේ වගා නොකර අතහැර දමා තිබෙන කුඹුරුවල සම්ප්‍රදායික වී වර්ග වගා කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලෙස දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා මහතා දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ සභාපතිවරයාට උපදෙස් ලබා දී ඇත.

ගාල්ල, මාතර, හම්බන්තොට දිස්ත්‍රික්ක තුළ විශාල කුඹුරු ප්‍රමාණයක් කරදියට නිරාවරණය වීම නිසා ජලවහනය නිසි ලෙස සිදුනොවීම නිසාත් වාරි පහසුකම් නොමැති නිසා අතහැර දමා ඇති නමුත් එවැනි කුඹුරුවල වගා කළ හැකි සම්ප්‍රදායික වී වර්ග පවතින බව සොයාගෙන තිබේ. මේ වී වර්ග ගොවීන්  අතර ප්‍රචලිත කර ඔවුන් නැවත වගා කටයුතුවලට යොමු කර ගැනීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වී තිබෙන බව මේ පිළිබඳ අදහස් දක්වා ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා මහතා පැවසීය.

වැඩිදුරටත් අදහස් දක්වූ ප්‍රධාන අමාත්‍යවරයා දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ මැදිහත්වීම මත මාතර නිල්වලා යෝජනා ක්‍රමයට ආශ්‍රිතව අතහැර දමා තිබූ කුඹුරු විශාල ප්‍රමාණයක මේ වන විට සම්ප්‍රදායික වී වර්ග ඉතා සාර්ථකව වගා කර ඇති බවත් එම කටයුත්තෙන් ලැබූ අත්දැකීම මේ වැඩපිළිවෙල පළාත පුරා ප්‍රචලිත කිරීමට විශේෂයෙන් හේතු වූ බව පැවසීය.

ඒ අනුව කරදියට ඔරොත්තු දෙන  වී වර්ග කරදිය සඳහා නිරාවරණය වන බිම් ප්‍රදේශවලත් අඩු ජල සැපයුමක් උපයෝගී කර ගනිමින් අස්වැන්න ලබා දෙන වී වර්ග වියලි ප්‍රදේශ සඳහාත් වගුරු බිම්වලට සාර්ථකව වගා කළ හැකි වී වර්ග එබඳු කුඹුරු සඳහාත් ලබා දීමට මේ වැඩසටහන අනුව සිදු කෙරෙනු ඇත.

සම්ප්‍රදායික වී වර්ග වගාවට වැඩි කාලයක් ගතවීම හා අස්වැන්න අඩු බවට ඇති මතය මේ වගා කටයුතුවලින් ගොවීන් ඈත්වීමට බලපා ඇති නමුත් වර්තමාන සම්ප්‍රදායික වී වලට ඇති ඉහල ඉල්ලුම එම තත්වය මග හැරවීමට හේතු වී ඇත.

මෙම වැඩසටහන යටතේ සම්ප්‍රදායික වී වගා කිරීමට අපේක්‍ෂා කරන ගොවීන් ඒ සඳහා අවශ්‍ය වී සහ කාබනික පොහොර දකුණු පළාත් සංවර්ධන අධිකාරිය මැදිහත්ව ලබා දීමට නියමිතව ඇති අතර වගා උපදෙස් සම්ප්‍රදායික වී වගා කටයුතුවල ප්‍රායෝගිකව නියැලෙන ස්වේච්ඡා සංවිධානවල ආධාර ගොවීන්ට ලබා දෙනු ඇත.

## දුර ගමන් මගී ප්‍රවාහන බස් රථ සඳහා ආහාරපාන සපයන ආපනශාලා දැඩි අධීක්ෂණයට ලක් කිරීමට දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යවරයා උපදෙස් ලබා දී ඇත.

දුර ගමන් සේවා බස් රථ සඳහා ආහාර පාන සපයන දකුණු පළාතේ ආපන ශාලාවල තත්වය වැඩි දියුණු කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙස පළාත් ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා මහතා විසින් පළාත් සෞඛ්‍ය ලේකම්වරයා වෙත උපදෙස් ලබා දී ඇත.

මෙම ආපනශාලාවල සේවාව පිළිබඳ මගීන්ගෙන් ලද චෝදනා පෞද්ගලිකව පරීක්ෂා කිරීමෙන් පසු ප්‍රධාන අමාත්‍යවරයා විසින් මෙම පියවර ගෙන ඇත.

මෙම අධීක්ෂණ කටයුතු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය, පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය හා පළාත් පාලන දෙපාර්තමේන්තුව යටතේ සේවය කරන නිලධාරීන්ගෙන් සැදුම්ලත් කමිටුවක් මඟින් සිදු කරනු ලබන අතර එහිදී ආපනශාලාවේ පිරිසිදුබව ආහාරපාර සඳහා අයකරනු ලබන මිල ගණන් හා ඒවායේ ප්‍රමිතිය විශේෂ සැලකිල්ලට භාජනය කෙරෙනු ඇත.

පරීක්ෂා කිරීමේදී ආපනශාලාවල පවතින අඩුපාඩු පිළිබඳ ආපනශාලා හිමිකරුවන් දැනුවත් කිරීමත් නීතිරීති උල්ලංඝනය කර ඇති අවස්ථාවල ඒ සඳහා නෛතිකව කටයුතු කිරීමත් සිදු කිරීමට නියමිත ඇති අතර පූර්ව දැනුම් දීමකින් තොරව ආපන ශාලා අධීක්ෂණය සිදු කිරීමට කටයුතු සංවිධානය කර ඇත.

මෙම අධීක්ෂණය සිදුවන අවස්ථාව සඳහා ක්ෂණික දැනුම් දීම මත මාධ්‍යවේදීන් සහභාගි කර ගැනීමටද ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා මහතාගේ අවධානය යොමු වී ඇති ඉතා නිවැරදිව මෙම කටයුතු ඉටු කිරීමටත් ආපනශාලාවලින් හොඳ සේවයක් බස් මගීන්ට ලබා දීමටත් හොඳ ප්‍රවේශයක් ලබා ගත හැකිවනු ඇති බවට ප්‍රධාන අමාත්‍යතුමා බලාපොරොත්තු පළ කරයි.